දුරකථන ) 011 2669192 , 011 2675011
தொலைபேசி ) 011 2698507, 011 2694033
Telephone ) 011 2675449, 011 2675280

ෆැක්ස් ) 011 2693866
பெக்ஸ் ) 011 2693869
Fax ) 011 2692913

විද්‍යුත් තැපෑල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல ) MA/MS/L/4/2014(tem)
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2017.10.08
Date )

# සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதார, போசணை மற்றும் சுதேச வைத்திய அமைச்சு
# Ministry of Health, Nutrition & Indigenous Medicine

පොදු චක්‍රලේඛ අංක :- 01 - 60 /2017

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලංකා ජාතික රෝහල),

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් සහ වැඩසටහන් අධ්‍යක්ෂවරුන්,

ජාතික රෝහල්, ශික්ෂණ රෝහල්, පළාත් රෝහල්, විශේෂ රෝහල්, ජයවර්ධනපුර,

යුධ හමුදා, ගුවන් හමුදා සහ පොලිස් රෝහල් අධ්‍යක්ෂවරුන්,

මූලික රෝහල්වල වෛද්‍ය අධිකාරීන්,

<u>ශ්‍රේණි වෛද්‍ය නිලධාරීන් සඳහා වන ජාතික ආවේක්ෂණ පද්ධතිය (National Surveillance System) සහ මාසික වාර්තා සම්බන්ධවයි.</u>

සෞඛ්‍ය අමාත්‍යාංශය, සියළුම පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂවරුන් සහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්ගේද සියළුම රෝහල් සහ වැඩසටහන් අධ්‍යක්ෂවරුන්, වෛද්‍ය අධිකාරීන්ගේ ද සහය ඇතිව, සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ සේවය කරනු ලබන ශ්‍රේණි වෛද්‍ය නිලධාරීන් සඳහා මාර්ගගත විද්‍යුත් ආවේක්ෂණ පද්ධතියක් (**Online E-Surveillance System**) හඳුන්වා දී ඇත. මෙය ඉතා සරල වන නමුත් වෛද්‍ය සේවා අධ්‍යක්ෂක ශාඛාව කේන්ද්‍රීය කරගෙන ක්‍රියාත්මක කළ හැකි වලංගු ගූගල් දත්ත පත්‍රිකාවකි (**Valid Google Data Sheet**). නමුත්, ආයතනයට අනුයුක්තව සේවය කරන වෛද්‍ය නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු නඩත්තු කරනු ලබන විෂය ලිපිකරු විසින් අදාළ ආයතන ප්‍රධානීන්ගේ අධීක්ෂණය සහ මග පෙන්වීම යටතේ මෙම දත්ත පත්‍රිකාව නඩත්තු කිරීම සහ යාවත් කිරීම සිදුකළ යුතුය. ඔබ ආයතනයේ අදාළ විෂයභාර ලිපිකරුවන් සඳහා මේ සම්බන්ධව පුහුණුව ලබා දී ඇති අතර වැඩිදුර විස්තර **HRMIS** ඒකකයෙන් ලබාගත හැකිය.

385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. 385இ வணக்கத்துக்குரிய பத்தேகம விமலவங்ச தேரோ மாவத்தை, கொழும்பு 10.
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha, Colombo 10, Sri Lanka.

ඒකක/වාට්ටු මට්ටම දක්වා ඔබ ආයතනයට අනුයුක්ත වෛද්‍ය නිලධාරීන්ගේ විස්තර මෙම දත්ත පත්‍රිකාවේ අන්තර්ගත වන අතර එමනිසා ඕනෑම අවස්ථාවක ඔබගේ ජංගම දුරකතනය හෝ පරිගණක පද්ධතිය හරහා මෙහි ඇති සියළුම සංඛ්‍යා හා පුරප්පාඩු පිළිබඳව විස්තර ලබාගත හැකිය. සෑම වර්ෂයකම සිදුවන විචලනයන් මාසිකව යථාවත් කිරීමට එක් එක් මාසය සඳහා තීරු (**columns**) 12ක් දක්වා ඇත. එමනිසා, කේන්ද්‍රීය, පළාත් සහ දිස්ත්‍රික්ක මට්ටමින් තීරණ ගැනීම සඳහා දෛනික තොරතුරු එක්රැස් කරමින්, මෙම දත්ත පද්ධතිය සතිපතා යථාවත් කිරීම තහවුරු කරන ලෙස දන්වා සිටිමි. රෝසපැහැ කඩදාසියේ මුද්‍රණය කර ඇති මාසික වාර්තාව, සෑම මසකම 05 වැනිදාට පෙර සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සේවා අධ්‍යක්ෂක ශාඛාව වෙත එවිය යුතුය. මේ පද්ධතිය වෙත ප්‍රවේශ වීම සඳහා අවශ්‍ය සම්බන්ධතාවය **G-mail** ඔස්සේ ලබා දී ඇති අතර මෙම කාර්යය සඳහා වෙනම **G-mail** ලිපිනයක් පවත්වාගෙන යන ලෙස දන්වා සිටිමි. මේ සඳහා අවශ්‍ය සම්බන්ධතාවය (**access**) සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් පමණක් ලබාදේ.

මෙම කාර්යාවලිය අඛණ්ඩව කරගෙන යෑම සඳහාත්, මෙම ආවේක්ෂණ ක්‍රියාවලිය පදනම් කරගනිමින් වෛද්‍ය නිලධාරීන්ගේ තොරතුරු ලබාදීමටත්, පරිපාලන නිලධාරී සහ වෛද්‍ය නිලධාරී (සැලසුම්) වෙත කරුණාකර උපදෙස් ලබාදෙන මෙන් දන්වා සිටිමි. මෙම තොරතුරු පද්ධතියේ සාර්ථකත්වය සඳහා ඔබ දක්වන කාරුණික සහයෝගය හා මගපෙන්වීම බෙහෙවින් අගය කරමි.

**ජනක සුගතදාස**
ලේකම්
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ජනක සුගතදාස

ලේකම්

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.